## WEATHER FORECAST FOR 08 NOVEMBER 2019
**(Issued at 05.30 a.m. on 08 November 2019)**

Showers or thundershowers will occur at a several places in Western province and in Galle, Puttalam and Trincomalee districts.

Showers or thundershowers will occur at several places elsewhere after 1.00 p.m.

Misty conditions can be expected at some places in Northern, North-central, Sabaragamuwa, Central, Western and Uva provinces during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

බස්නාහිර පළාතේත් ගාල්ල, පුත්තලම සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලත් තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සෙසු ප්‍රදේශවල තැනින් තැන සවස 1.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

උතුරු, උතුරු-මැද, සබරගමුව, මධ්‍යම, බස්නාහිර සහ ඌව පළාත්වල විශේෂයෙන් උදෑසන කාලයේදී ඇතැම් ස්ථානවල මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 08 November 2019)

**The cyclonic storm "Bulbul" in the Bay of Bengal sea area has developed into a severe cyclonic storm and now located near latitude 16.3N, longitude 87.9E. It is very likely to intensify into a very severe cyclonic storm during next 24 hours and move north-northwestwards towards west Bengal- Bangladesh coast.**

**Heavy showers or thundershowers, very strong winds and very rough seas can be expected in the sea areas between latitude 13N and 22N, longitude 83E and 94E. Naval and fishing communities (particularly multiday boats) are advised not to venture into above sea areas and requested to be vigilant in this regards till 11th November.**

Showers or thundershowers will occur at a several places in the sea areas around the island.

Winds will be South-westerly and speed will be (20-40) kmph in the sea areas around the island.

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

### ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
**2019 නොවැම්බර් මස 08 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති "බුල්බුල්" සුළි කුණාටුව මේ වනවිට, චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී ඇති අතර දැන් එය, උතුරු අක්ෂාංශ 16.3 ත් නැගෙනහිර දේශාංශ 87.9 ත් ආසන්නයේ පවතී. එය ඉදිරි පැය 24 තුළ ඉතා චණ්ඩ සුළි කුණාටුවක් බවට වර්ධනය වෙමින් උතුරු දෙසට බරව වයඹ දෙසට ගමන්කර බටහිර බෙංගාල- බංගලාදේශ වෙරළ දෙසට ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.

උතුරු අක්ෂාංශ 13ත් 22ත් සහ නැගෙනහිර දේශාංශ 83ත් 94ත් අතර මුහුදු ප්‍රදේශවල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි, ඉතා තද සුළං සමඟ මුහුදු ප්‍රදේශ ඉතා රළු විය හැක. නොවැම්බර් 11 වනදා දක්වා නාවික හා ධීවර ප්‍රජාවට (විශේෂයෙන්ම බහුදින ධීවර යාත්‍රාවලට) ඉහත මුහුදු ප්‍රදේශවලට යාත්‍රා නොකරන ලෙසට උපදෙස් දෙනු ලබන අතර මේ පිළිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සුළං නිරිත දිශාවෙන් හමන අතර සුළඟේ වේගය පැ.කි.මී. (20-40) පමණ වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019-11-08
Time: 0555 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE